පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

ආයතනයේ නම : <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට</u>

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம், ஹம்பாந்தோட்டை

பாராளுமன்றத்தின் அரச கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் தொடர்பாக, நிலையான கட்டளை 119 (4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான மாண்புமிகு அமைச்சரால் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகள் குறித்த பாராளுமன்றத்திற்கான சமர்ப்பிப்பு

Parliamentary Series No – 492

Name of the Institution: <u>District Secretariat Office - Hambantota</u>

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order No.119 (4)

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

**පාර්ලිමේන්තු මාලා අංක - 492**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට**

**පළමු කොටස : 82.00**

| | රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු | ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 01 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | මසක් ඇතුලත විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමට හැකිවන පරිදි නිලධාරීන් දැනුවත් කර ඇත.<br>විගණන විමසුම් බොහොමයකට නියමිත කාලය තුල පිළිතුරු සපයා ඇත. තවදුරටත් එය කඩිනම් කිරීමට කටයුතු කරමි. |
| 02 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම කඩිනම් කිරීමට අවශ්‍ය පුහුණු හා දැනුවත් කිරීම් සිදුකරන ලදි.<br>අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු බොහොමයක් නියමිත කාලය තුල ලැබී ඇත. තවදුරටත් කඩිනම් පිළිතුරු සැපයීමට ක්‍රියාකරමි. |
| 03 | විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 4ක් වත් පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වන ලදි. ප්‍රාදේශීය විගණන කළමනාකරණ කමිටු සියල්ල නිසි පරිදි පවත්වන ලදි.<br>2024/2025 සඳහා නියමිත පරිදි විගණන කළමනාකරණ කමිටු පවත්වා ඇත. |
| 04 | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට පියවර ගනිමින් සිටිමි.<br>සංචිත වාහන සියල්ලෙහි රාජ්‍ය ලාංඡනය පින්තාරුකර අවසන්ව ඇත. |
| 05 | වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | ගර්හිත වාහන වල ලියාපදිංචිය පිළිබඳ ගැටළු හා ලියාපදිංචි සහතික නොපැවතීම මත ප්‍රමාදයන් සිදුව ඇත. අදාල මූලික කටයුතු තවදුරටත් සිදුකරනු ලබයි.<br>ගර්හිත වාහන සම්බන්ධ චක්‍රලේඛ උපදෙස් පරිදි තක්සේරු කමිටු පත්කර ඉදිරි කටයුතු සිදුකරයි. |
| 06 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට චක්‍රලේඛ ප්‍රකාරව ගතහැකි සියළුම ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් දෙදෙනෙකුට එරෙහිව නඩු පවරා ඇති අතර 06 දෙනෙකුගෙන් ණය ශේෂ අයවෙමින් පවතී |

| | **රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු** | **ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන ප්‍රගතිය** |
|---|---|---|
| 07 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නිළධාරීන් දැනුවත් කර ඇත. |
| 08 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන්ට කඩිනමින් පියවීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දී ඇත.<br>තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවීම් කටයුතු සිදුකරනු ලබයි. |

<u>දෙවැනි කොටස : 80.00</u>

| | | |
|---|---|---|
| 01 | දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | පවතින රජයේ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන හිඟවීම හා නිවාස ඉල්ලීම් අවම වීම මත අවශ්‍ය පරිදි වර්ෂය තුල නිවාස කමිටු පවත්වන ලදි.<br>නිල නිවාස ඉල්ලීම් සලකා බලා අවශ්‍ය පරිදි නිවාස කමිටු පවත්වා ඇත. |
| 02 | දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | වර්ෂය තුල රටේ පැවති අර්බුධකාරී තත්වය මත අවස්ථානුකූලව පොහොර කමිටු පවත්වා ඇත.<br>පොහොර සහානාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවීම මත පොහොර කමිටු කන්නයකට අවශ්‍ය පරිදි පවත්වනු ලබයි. |
| 03 | දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මාසිකව රැස්වී නොතිබුනි. | දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව සැලකිය යුතු මිල වෙනස්කම් නොතිබුණු බැවින් අර්ධ වාර්ෂිකව පවත්වන ලදී.මිල ගණන්හි සුවිශේෂී වෙන්ස්කම් පැවතුනහොත් අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික් මිල කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |
| 04 | ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි. | DSH/ADM/17/REG/02 අංකය යටතේ 2022 වර්ෂයේ සිට RTI-11 ආකෘතිය යටතේ ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යයි. |
| 05 | **2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥාප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.** | **චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥාප්තිය නිසි පරිදි පිළියෙළ කර 2025 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබයි.** |

| | රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු | ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 06 | ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය නැවත සකස් කර ඇත. ඇගයීම් කටයුතු සඳහා නිලධාරීන් පත්කර ක්‍රියාත්මක කරනු ලබයි. . |
| 07 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / වයාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යටත්ව මතයක් ලබා දී ඇත.<br>ඉදිරියේදී පැහැදිලි මතයක් ලබා ගැනිමට ක්‍රියා කරමි. |
| 08 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි. | 2025 වර්ෂයේ සිට මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරීන් මගින් දිස්ත්‍රික් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු කාර්තුමය පවත්වා ඇත. |
| 09 | සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | දිස්ත්‍රික් පුහුණු අංශය දැනුවත් කර පුහුණු කටයුතු සිදු කිරිමට උපදෙස් ලබා දී ඇත.<br>ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබයි. |
| 10 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | සියලු නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත.<br>නිර්දේශ ක්‍රියාත්මක කිරිම සාර්ථක මට්ටමක පවති |
| 11 | සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 2024/2025 වර්ෂයට අදාලව සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත |
| 12 | දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 වරක් රැස් වී නොතිබුණි. | පරිසර නිලධාරීන් මාර්ගයෙන් පරිසර කමිටු පැවැත්විමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.<br>පරිසර කමිටු පැවැත්විමට කටයුතු කරමි |

.............................................

බිමල් ඉන්දජිත් ද සිල්වා ,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

.............................................

ජානක අමරරත්න,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට.

ජානක අමරරත්න
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කා...
හම්බන්තොට.

### ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

### ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.